# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2060/12 - 2018 පෙබරවාරි මස 27 වැනි අඟහරුවාදා - 2018.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ පිරිපහදු නල මාර්ග එලීම සඳහා යෝජිත ප්‍රවේශ මාර්ගයේ පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 21 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1347

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 250 පිටකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිටකන්ද ගමේ (ඉඩමේ නම නොදනී) අමුණා ඇති සැලැස්මේ කැබලි අංක 01 ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 2.5ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | නානායක්කාර මහතා හිමිකම් කියන වෙනත් ඉඩම් කොටසක් (අධ්‍යාපන ආයතනය පිහිටි ඉඩම) ; |
| *නැගෙනහිරට* | : | පරණ මාතලේ මාර්ගය ; |
| *දකුණට* | : | නානායක්කාර මහතා හිමිකම් කියන ඉඩම් කොටසක් හා වයලට් ගුණරත්න මිය හිමිකම් කියන ඉඩම් කොටස ; |
| *බටහිරට* | : | වයලට් ගුණරත්න මිය හිමිකම් කියන ඉඩම් කොටස. |

1A - G 27213— 29 (2018/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 01. පූජ්‍ය වෙඩරුවේ උපාලි ගුණරත්න ස්වාමීන් වහන්ස,
විහාරාධිපති, අස්ගිරි ගෙඩිගේ රජමහා විහාරය,
අස්ගිරිය - මහනුවර.

02. වයලට් ගුණරත්න මිය,
ටී. සියඹලාගස්තැන්න පාර,
මහනුවර.

03. නානායක්කාර මහතා,
අංක : 21/5, මෙත්සිරිපාය,
කටුගස්තොට - සහ තවත් අය.

03-601

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දෙහිවල - ගල්කිස්ස අප ජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක : 10, පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 16 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1325

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 538C, සරණංකර ග්‍රාම නිළධාරී වසමේ සරණංකර පාරේ පිහිටි අංක 28/10, දරන ප්‍රමාණයෙන් පර්චස් : 06 ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| උතුරට | : | ඇල රක්ෂිතය. |
| නැගෙනහිරට | : | අංක : 6A, ව්‍යාපාරික ස්ථානය. |
| දකුණට | : | ශ්‍රී සරණංකර පාර. |
| බටහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : සොයාගත නොහැක.

03-602

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.